(නවවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

අංක 1(5).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

නිකුත් කළේ 2022 සැප්තැම්බර් 16 සිකුරාදා

### 2022 ඔක්තෝබර් 05 බදාදා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2979/2022

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වකුගඩු රෝගීන්ගේ රුධිර කාන්දුකරණය සඳහා මාතලේ, විල්ගමුවේ ඉදිකිරීම් ආරම්භ කරන ලද රෝහලේ වර්තමාන ප්‍රගතිය කවරේද;

(ii) මේ වනවිට, එම ඉදිකිරීම්වලින් අවසන් කර ඇති ප්‍රමාණය කොපමණද;

(iii) ඉහත ප්‍රදේශය අවට රුධිර කාන්දුකරණය අවශ්‍ය වකුගඩු රෝගීන් 2000කට වඩා සිටින බව දන්නේද;

(iv) එම රෝගීන්ට ප්‍රතිකාර ලබා ගැනීම සඳහා අධික වියදමක් දරමින් වෙනත් රෝහල්වලට යාමට සිදු වී ඇති බව දන්නේද:

(v) ඉහත සඳහන් රෝහලේ වැඩකටයුතු අවසන් කර, එය විවෘත කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

### 2022 ඔක්තෝබර් 06 බ්‍රහස්පතින්දා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

3040/2020

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 සහ 2015 යන වර්ෂ වෙනුවෙන් පොල් පර්යේෂණ ආයතනය විසින් සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු දායක මුදල් ගෙවා තිබේද;

(ii) නොඑසේ නම්, ඉහත සඳහන් වර්ෂ වෙනුවෙන් එම ආයතනය විසින් සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු දායක මුදල කොපමණද;

(iii) එම මුදල සේවක අර්ථසාධක අරමුදල වෙත ගෙවීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ආයතනය විසින් සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් නොගෙවීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදු කර තිබේද;

(ii) එසේනම්, ඊට අදාළ පරීක්ෂණ වාර්තාව ඉදිරිපත් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3146/2022

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමාජ මාධ්‍ය පාලනය කිරීම සඳහා නව නීති පැනවීමට අදහස් කර තිබේද;

(ii) එවකට අධිකරණ අමාත්‍යවරයා විසින් සිංගප්පූරු රජය සමඟ මේ පිළිබඳ සාකච්ඡාවක් පවත්වා ඇති බව පිළිගන්නේද;

(iii) සමාජ මාධ්‍ය සම්බන්ධයෙන් රජයේ ස්ථාවරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2022 ඔක්තෝබර් 07 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1673/2022

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වතු කම්කරුවකුගේ දෛනික වැටුප කොපමණද;

(ii) එම දෛනික වැටුප, රුපියල් 1000/-ක් දක්වා වැඩි කිරීම සඳහා තීරණය කර තිබේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1896/2022

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගම්පහ දිස්ත්‍රික්කයේ ඇති ජාතික පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) "සෞභාග්‍යයේ දැක්ම" වැඩසටහන යටතේ ජාතික පාසල් බවට පත් කරන ලද පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවායේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (iv)හි සඳහන් පාසල් තෝරා ගැනීමේදී අනුගමනය කරන ලද ක්‍රමවේදය කවරේද;

(ii) ජාතික පාසල් බවට පත් කරනු ලබන පාසල්වලට ලබා දෙනු ලබන පහසුකම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2001/2022

ගරු ජේ.සී. අලවතුවල මහතා,— වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ අභයභූමිවල සහ වනාන්තරවල සැරිසරන වන අලි සංඛ්‍යාව කොපමණද;

(ii) ජනතාව සහ ඔවුන්ගේ දේපළ එම වන අලින්ගෙන් ආරක්ෂාකර ගැනීම පිණිස අලිවැට ඉදිකිරීමට සැලසුම් කර තිබේද;

(iii) එසේ නම්, එම එක් එක් අලිවැට ඉදිකිරීමට අපේක්ෂා කරනු ලබන ගම, එම ගම අයත්වන ග්‍රාම නිලධාරි වසම සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම එක් එක් අලිවැට ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු කර ඇති මුදල, ඉදිකිරීම් ආරම්භ කරනු ලබන දිනය සහ අවසන් කිරීමට අපේක්ෂා කරනු ලබන දිනය වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2039/2022

ගරු ලලිත් එල්ලාවල මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජනතා විමුක්ති පෙරමුණේ හිටපු නායක රෝහණ විජේවීර මහතාව 1989.11.12 වන දින එවකට පැවති රජය විසින් අත්අඩංගුවට ගෙන ඒ බව මාධ්‍ය මඟින් ප්‍රකාශයට පත් කරන ලද බවත්;

(ii) 1989.11.13 වන දින ඔහු මිය ගොස් ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) රෝහණ විජේවීර මහතාගේ මරණය ස්වභාවික මරණයක්ද;

(ii) නොඑසේ නම්, ඝාතනයක්ද;

(iii) එම මරණය ඝාතනයක් නම්, ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ අධිකරණයක් මඟින් ලබා දෙන ලද නඩු තීන්දුවක් තිබේද;

(iv) මෙම මරණය සම්බන්ධයෙන් ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයකු හෝ නායකයකු හෝ විසින් නීති මඟින් කටයුතු කිරීමට පියවර ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2040/2022

ගරු වේලු කුමාර් මහතා,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, පහත හේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පදිංචි පවුල් අතරින් පානීය නල ජල පහසුකම් සහිත පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවතින පානීය ජල ගැටලුව විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2061/2022

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයේ තුන්වැනි අදියර ආරම්භ කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා වැය කරනු ලබන මුදල කොපමණද;

(iii) එම අරමුදල් සපයා ගනු ලබන මූලාශ්‍රය කවරේද;

(iv) ඒ යටතේ සිදුකිරීමට අපේක්ෂිත විදුලිබල උත්පාදනය මෙගාවොට් කොපමණද;

(v) මෙම ව්‍යාපෘතිය සඳහා ටෙන්ඩර් කැඳවීමක් සිදු කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2171/2022

ගරු රෝහණ බංඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මැදවච්චිය, අ/ මෛත්‍රීපාල සේනානායක මධ්‍ය මහා විද්‍යාලය මේ වනවිට විශාල පරිහානියකට ලක්වෙමින් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, එම පරිහානිය වැළැක්වීම සඳහා ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2519/2022

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ ස්ථාපිත කර ඇති ජාතික අධ්‍යාපන පීඨ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම අධ්‍යාපන පීඨවල එක් එක් භාෂා මාධ්‍ය අනුව පවත්වනු ලබන පාඨමාලා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම පාඨමාලාවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විද්‍යාපීඨ ගුරු පුහුණුව සඳහා සිසුන් හිඟයක් පවතින බව දන්නේද;

(ii) එසේ නම්, එම ගැටලුව විසඳීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3084/2022

ගරු තිසකුට්ටි ආරච්චි මහතා,— කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දකුණු කොරියාවේ රැකියාවල නියුක්තව සිටින ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 05ක කාලයක් සඳහා ඔවුන්ට ලබා දී තිබෙන වීසා අවසන් වීමෙන් පසු, එම වීසා කාලය නැවත දීර්ඝ කරන්නේද;

(iii) ඔවුන් විසින් ශ්‍රී ලංකාවට වාර්ෂිකව එවනු ලබන විදේශ විනිමය ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3115/2022

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා,— මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කඩදාසි සහ මුද්‍රණ කටයුතු සඳහා භාවිතා කරනු ලබන තීන්ත වර්ග ආනයනය කිරීම සඳහා වාර්ෂිකව වැය කරනු ලබන මුදල කොපමණද;

(ii) ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන මුළු කඩදාසි සහ මුද්‍රණ කටයුතු සඳහා භාවිතා කරනු ලබන මුළු තීන්ත වර්ග ප්‍රමාණයෙන් රාජ්‍ය අංශය විසින් භාවිතා කරනු ලබන ප්‍රමාණය කොපමණද;

(iii) ඉහත සඳහන් ද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා වැය කරනු ලබන විදේශ විනිමය ඉතිරි කර ගැනීම සඳහා නිසි වැඩපිළිවෙළක් සකස් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රාජ්‍ය අංශයේ ලිපි ගනුදෙනුවලදී නවීන තාක්ෂණය භාවිතා නොකිරීමට හේතු කවරේද;

(ii) නවීන තාක්ෂණය භාවිතා කිරීමට බාධාවන චක්‍රලේඛ හා රෙගුලාසි තිබේ නම්, ඒවා සංශෝධනය කිරීම සඳහා පියවර නොගැනීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?